සිංහල භාෂාව හා සාහිත්‍යය - 7 ශ්‍රේණිය

**සුදන ගුණ**

**ර/බළ/ සමනලවත්ත විද්‍යාලය**

ජීවිතයේ යහපැවැත්ම හා ඊට සම්බන්ධ උපදෙස් පිළිබඳ කාව්‍ය අතීතයේ පටන් ලියවී ඇත.

ආගමික හා රාජ්‍ය නීතිය සම්බන්ධ උපදෙස් දීමේ අරමුණින් මේවා රචනා කර ඇත .




මෙම සාහිත්‍යය උපදේශාත්මක සාහිත්‍යය ලෙස හඳුන්වයි.


සිංහල උපදේශ සාහිත්‍යය සංස්කෘත හා දෙමළ උපදේශ සාහිත්‍යයෙන් පෝෂණය වී ඇත.


සිංහලයේ හමුවන උපදේශ කාව්‍ය තුනකි. ඒවා නම්,

ලෝවැඩ සගරාව




සුභාෂිතය




ලෝකෝපකාරය

රණස්ගල්ලේ හිමි විසින් රචිත ලෝකෝපකාරයෙන් උපුටා ගත් කවි පහක් මෙම පාඩමේ දැක්වේ.

ලෝකෝපකාරය , තිරුක්කුරල් නම් ද්‍රවිඩ ග්‍රන්ථයේ පරිවර්තනයක් බව කියවේ.

චාල්ස් සිල්වා මහතා ද මෙය සීගිරි ගීය නමින් පරිවර්තනය කර ඇත.

## තිරුක්කුරල්

**තිරුක්කුරල්** යනු ක්‍රි.ව. 3 - 6 සියවස් අතර කාලයේ ලියැවී ඇතැයි සැලකෙන දෙමළ උපදේශ කාව්‍ය සංග්‍රහයකි. එහි කතුවරයා තිරුවල්ලුවර් නමැත්තෙකු බව පිළිගැනෙයි. පරිච්ඡේද දහයකින් යුතු මෙම ග්‍රන්ථයේ ඇතුළත් උපදේශ පද්‍ය සංඛ්‍යාව 1330කි. මෙය ජාති, ආගම්, කුල භේදයකින් තොරව සමස්ත සමාජයේ ම යහ පැවැත්මට උපදෙස් ලබා දෙන කෘතියකි.

චාල්ස් ද සිල්වා මහතා **සිරි ගීය** නමින් **තිරුක්කුරල්** පරිවර්තනය කර ඇති අතර මෙම පාඩමට ඇතුළත් වන්නේ ගොරොක්ගොඩ මිසිහාමිගේ **තිරුක්කුරල්** පරිවර්තනයෙන් උපුටා ගත් කවි පහකි.

**උදව්වක් වශයෙන් කිසිවක් නො කළ කෙනෙකුට**
**කරන උපකාරය අහසටත් පොළවටත් නො සමයි**

තමාහට උපකාරයක් නො කළ කෙනෙකුට කරන උදව්ව අහසටත් පොළවටත් සම කළ නො හැකි ය. ඊටත් වඩා වටින්නේ ය.

**නිසි කලට කෙනෙකුට කළ උපකාර වූ නම්**
**එය ඉතා සුළු වුව මහා ලොවටත් වැඩි විශාලයි**

සුදුසු අවස්ථාවට කෙනෙකුහට උපකාරයක් කළ හොත් එය කුඩා උපකාරයක් වුවත් එහි වටිනාකම මුළු ලෝකයටත් වඩා විශාල ය.

**ලබන පල නොසිතා කළ උදව්වෙහි හොඳ බව**
**මනින්නට හැකි නම් මහා මුහුදට වැඩි විශාලයි**

ආපසු ලැබෙන ප්‍රයෝජන ගැන නො සිතා කළ උපකාරයක වටිනාකම, මැනීමට හැකි නම් එහි අගය මහා මුහුදටත් වඩා විශාල ය.

**කෙනෙකුන් කළ ගුණය අමතක වීම නරකයි**
**අගුණ කළ විටකදී වහා අමතක වීම යහපති**

කෙනෙකු තමාට උපකාරයක් කළ විට එය අමතක කිරීම සුදුසු නො වේ. අගුණයක් කළ හොත් ඉක්මනින් අමතක කළ යුතු ය.

**ගැලවීමට හැකි ය බිඳලුව නමුදු හැම ගුණ**
**කළ ගුණ නො තැකුවොත් නො හැකි වේ ගැලවීම ලැබුමට**



හැම ගුණ ධර්මයක් ම කඩ කළ හොත් බේරීමට හැකි ය. එහෙත් කළ ගුණ නො තැකුව හොත් ගැලවීමක් ලැබිය නො හැකි ය.

ලෝකෝපකාරය කෝට්ටේ යුගයට අයත් ග්‍රන්ථයක් වන අතර එහි කවි 238ක් තිබේ.

මෙම පාඩමේ කවි පහක් විස්තර කර ඇත.

## ලෝකෝපකාරය

ලෝකෝපකාරය කෝට්ටේ යුගයේ දී රණස්ගල්ලේ හිමියන් විසින් රචනා කරන ලද උපදේශ කාව්‍ය ග්‍රන්ථයකි. මෙහි කවි 238ක් දක්නට ලැබේ. යහපත් ජීවිතයක් සඳහා අවශ්‍ය උපදේශ ලබා දෙන කෘතියක් ලෙස ලෝකෝපකාරය වැදගත් වේ.

ඉහත අපගේ අවධානයට යොමු වූ තිරුක්කුරල් නම් ග්‍රන්ථයේ බලපෑම ලැබූ පොතක් ලෙස ද **ලෝකෝපකාරය** හැඳින්විය හැකි ය. පහත දැක්වෙන්නේ ලෝකෝපකාරයෙන් උපුටා ගත් කවි කිහිපයකි.

**ඉසුරෙන් පිරිහුණත්**
**සුදන තම ගුණය අඩු නො කරත්**
**බිඳුණත් රන් බඳුන**
**ඇති බර අගය අඩු නොවන මෙන්**

සම්පත්වලින් පරිහානියට පත් වුණත් සුදනෝ තම ගුණ දම් රැකීම අඩු නො කරති. කෙසේ ද යත්, රන් භාජනය කැඩුණත් එහි වටිනාකම හා බර අඩු නො වන්නාක් මෙනි.

**සුදනෝ තම සිරිත්**
**කළවුන් තමන් ලෙස ම සලකත්**
**පහනින් ගත් පහන්**
**එක ලෙස ම බබළන විලස්නෙන්**

යහපත් ජනයා තමන්ගේ ගුණ අනුගමනය කරන අය තමා සේ ම සලකති. එය පහනකින් දැල්වූ අනෙක් පහන් සියල්ල ම එක ලෙස ආලෝකයෙන් බබළන්නාක් මෙනි.

**රන් බඳුනෙහි කෙසර**
**තෙල් අඩු නොවී පවතින මෙන්**
**උතුමන් හද සපිරි**
**කුලුණු මෙත් අඩු නොවී පවතියි**

රත්රන් භාජනයෙහි තබා ඇති කේසර සිංහයාගේ තෙල් හිඳෙන්නේ නැති නිසා අඩුවක් නො වී ඒ ලෙසින් පවතී. ඒ සුදනන්ගේ/උතුම් ජනයාගේ හදවතෙහි පිරී ඇති කරුණා මෙත් ගුණය අඩුවක් නො වේ. කුලුණු මෙත් ගුණය හෙවත් කරුණාව යනු අනිත් අයගේ දුක දැක තමාගේ හද කම්පා වන, ශෝක වන ගුණය යි.

**මේඝ ගං පල තුරු**
**පරහට ම වැඩ පමුණුවන මෙන්**
**සුදනන් ලත් ඉසුරු**
**සව් සතට වැඩ වේ ය නිතියෙන්**

මහා වර්ෂාව, ගංගා, ගෙඩිවලින් පිරුණු ගස් අන් අයට යහපත සලසයි. එමෙන් ම සුදනෝ තමා ළඟ ඇති සම්පත් සියලු ජනයාගේ යහපතට නිතර යොදවති.

**තමහට නොසරි වන**
**සබා මැද ඉඳිනුව කර බා**
**සඳ දැක කොඳ පුබුදු**
**වනු දැක පියුම් හැකිළෙන මෙන්**

තම අදහසට නො ගැළපෙන සභාවක් මැද ඉන්නා විට නිශ්ශබ්දව සිටීම සුදුසු ය. එය චන්ද්‍රයා පායනු දැක, කුමුදු මල් පිපෙනු දැක, නෙලුම් මල් පර වෙන්නාක් මෙනි.

01 වන කවිය

යහපත් මිනිසුන්ට ධන සම්පත් අඩු වුවද ඔවුන්ගේ යහපත් ගතිගුණ අඩු වන්නේ නැත. R රන් භාජනයක් කැඩුණත් බර අඩු වන්නේ නැති සේම යහපත් මිනිසුන් ද එසේම ය.

02 වන කවිය

එක් පහනකින් දැල්වූ තවත් පහන් ආලෝකයෙන් බබළන්නා සේ යහපත් මිනිසුන්ව අනුගමනය කරන අනෙක් මිනිසුන් ද එසේම යැයි ඔවුහු සිතති.

03 කවිය

රත්තරන් භාජනයක තබා ඇති සිංහයාගේ තෙල් හිදෙන්නේ නැත. එමෙන්ම සුදනන්ගේ ( යහපත් පුද්ගලයන්ගේ) ගතිගුණ ද වෙනස් නොවේ. කුලුණු ගුණය යනු අන් අයගේ දුක දැක ඉපදෙන කරුණා ගුණය යි.

04 වන කවිය

මහ වර්ෂාව , ගංගා සහ ගෙඩිවලින් පිරුණු ගස් අන් අයට යහපත සලසයි. එමෙන්ම සුදනන්ගේ යහපත් ගතිගුණ අන් අයට ද බලපායි.

05 වන කවිය

තම අදහස්වලට නොගැළපෙන සභාවක ඉන්නා විට නිශ්ශබ්දව සිටීම සුදුසු ය.එය චන්ද්‍රයා පායනු දැක කුමුදු මල් පිපෙනු දැක නෙළුම් මල් පරවෙන්නාක් මෙනි.

පාඩමේ අභ්‍යාස කරන්න .

## අවබෝධය

1. බිඳුණු රන් භාජනය උපමාවක් ලෙස ගත්තේ කුමක් ගැන කීමට ද?
2. "කුලුණු මෙත් ගුණය" පැහැදිලි කරන්න.
3. එම ගුණය උපමා කර ඇත්තේ කුමකට ද?
4. ස්වභාව ධර්මයේ සිදුවීමක් ගැන අවසාන කවියේ දක්වා ඇත. එය කුමක් ද?



## ලිඛිත අභ්‍යාස

1. මෙම පදවලට විරුද්ධ අර්ථ දෙන පද ලියන්න.

   සුදන -      වැඩ -
   සිරිත් -      මෙත් -
   පුබුදු -

2. සමාන පදය ලියන්න

   ඉසුරු -      සුදන -
   හැකිළෙන -      සඳ -
   පියුම් -

3. මෙම කවි පන්ති දෙක ඇසුරින් මිනිසුන්ගේ ජීවිතය සාර්ථක කර ගැනීමට උදවු වන සාරධර්ම ලේඛනයක් පිළියෙල කරන්න.
4. උපදේශ ග්‍රන්ථ කීපයක නම් ලියන්න.
5. මෙම පාඩමින් ඔබේ ජීවිතයට එකතු කර ගත හැකි සාරධර්ම සතරක් ලියන්න.

## ප්‍රායෝගික අභ්‍යාස

1. ඔබ මෙම පාඩමින් උගත් කරුණු හා තවත් උපදේශ ග්‍රන්ථ කියවා කරුණු එක් රැස් කොට "සුදන ගුණ" නමින් බිත්ති පුවත්පතට ලිපියක් ලියන්න.